# ඉදිකිරීම්/නඩත්තු කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2017
## ප්‍රධාන ලේකම් කාර්යාලය
## මධ්‍යම පළාත

උක්ත කාරණයට අදාළව 2016-11-18 වන දින පළවූ පුවත්පත් දැන්වීම හා බැඳේ. එහි පළවූ පරිදි 2017 වර්ෂය සඳහා මධ්‍යම පළාත් සභාවේ සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනවල රුපියල් මිලියන 50 දක්වා වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් / නඩත්තු කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් නිකුත් කිරීමේ කාලය 2017-01-06 වන දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන කොන්ත්‍රාත්කරුවන් සඳහා,

(01.) අයදුම්පත හා විස්තර මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ දෙවන මහලේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයෙන් 2017-01-06 වන දින දක්වා සතියේ වැඩ කරන දිනවල පැය 0900 සිට පැය 1500 දක්වා පැමිණ ලබා ගත හැක. www.cs.cp.gov.lk වෙබ් අඩවිය මගින්ද විස්තර හා අයදුම්පත ලබා ගත හැක.

(02.) සම්පූර්ණ කරන ලද අයදුම්පත, 2017-01-10 වන දින පෙ.ව.10.30 ට හෝ එදිනට පෙර ලියුම්කවරයේ වම්පස ඉහල කෙළවරේ "ඉදිකිරීම්/නඩත්තු කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2017" යනුවෙන් සඳහන් කර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය හැක.

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා),<br>
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය,<br>
තැ.පෙ. 102,<br>
මධ්‍යම පළාත් සභා සංකීර්ණය,<br>
පල්ලේකැලේ, කුණ්ඩසාලේ.

(03.) මධ්‍යම පළාතේ අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක දැනටමත් ලියාපදිංචි වී, එම ලියාපදිංචිය 2017 වර්ෂය සඳහා වලංගු වුවද, එම කොන්ත්‍රාත්කරුවන්ද මෙම ලියාපදිංචිය ලබා ගත යුතුය. කුමන හෝ ශ්‍රේණියක ලියාපදිංචිය ඇති කොන්ත්‍රාත්කරුවකුට මධ්‍යම පළාත තුළ මිලියන 50 දක්වා කොන්ත්‍රාත් භාර ගැනීම සඳහාද මෙම ලියාපදිංචිය ලබා ගත යුතුය.

(04.) පැහැදිලි කරගැනීම්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයෙන් විමසා ලබා ගත හැක. දුරකථන අංකය 081-2233725

ප්‍රධාන ලේකම්,<br>
මධ්‍යම පළාත.<br>
2016-12-20